## නාට්‍ය හා රංග කලාව ප්‍රයෝගික ක්‍රියාකාරකම් පාටමාලාව (Drama Beyond Classroom Programme) මැයි 2024

### ආයතනය පිළිබඳ හැඳින්වීමක්

1981 දී සෝමලතා සුබසිංහ විසින් ලංකා ළමා හා යෞවන රඟහල පදනම (LCYTF) සහ එහි නාට්‍ය නිෂ්පාදන සහ පුහුණු අංශය වන සෝමලතා සුබසිංහ ප්ලේහවුස් (Somalatha Subasinghe Play House) ස්වේච්ඡා සංවිධානයක් ලෙස ආරම්භ කරන ලදී. විශේෂයෙන් ළමයින් සහ තරුණයින් සඳහා නාට්‍ය නිෂ්පාදනය සහ ප්‍රසංග ප්‍රවර්ධනය කිරීම, නළුවන් පුහුණු කිරීම සහ නාට්‍ය පර්යේෂණ අධ්‍යයන යනාදිය මෙම ආයතනයේ අරමුණු විය. වර්තමානය වනවිට මෙම ආයතනය ළමා හා යොවුන් නාට්‍ය නිෂ්පාදනය, රඟදැක්වීම, අධ්‍යයනය සහ පුහුණුව පිළිබඳ ලංකාවේ පුරෝගාමී සංවිධිත ආයතනය වෙයි. 1981 වර්ෂයේ සිට ළමුන් හා යෞවනයින් සඳහා සංගීතමය නාට්‍ය හා වැඩිහිටි ප්‍රේක්ෂාගාරය සඳහා ප්‍රධාන ප්‍රවාහයේ නාට්‍ය ද බොහෝ සංඛ්‍යාවක් නිෂ්පාදනය කර ඇත. එම නාට්‍ය ලංකාව තුළ මෙන්ම විදේශවලදී ද රඟ දක්වා ඇත. මෙම ආයතනය 2007 ජනවාරි මාසයේදී අංක 03 දරන ආඥා පනත මඟින් "ලංකා ළමා හා යොවුන් රඟහල පදනම" ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සංස්ථාගත කරන ලදී.

### වැඩසටහන පිළිබඳ හැඳින්වීමක්

නාට්‍ය හා රංග කලාව ඉගෙනීම ට සහභාගී වන දරුවන්ට එය ප්‍රීතිමත් අත්දැකීමක් බවට පත් කිරීම වැඩසටහනේ මූලික අරමුණයි. නාට්‍ය හා රංග කලාවේ මූලික අංග දරුවාට පහසුවෙන් තේරුම් ගත හැකි අයුරින් ඉදිරිපත් කර ඇති අතර එමඟින් තුලනාත්මක අවබෝධයක් හා ළමුන්ගේ ක්‍රීඩාශීලීත්වය, ප්‍රබෝධමත්භාවය සහ මූලික කලා ශිල්ප එනම්, සංගීතය, නැටුම්, රංගනය යනාදිය පිළිබඳව ළමුන්ගේ රසඥතාවය වර්ධන කිරීමය.

මෙම වැඩසටහන සමස්තයක් ලෙස කලින් සැලසුම්කරණ ලද ක්‍රියාකාරකම් මත පදනම් වන අතර එමගින් ඔවුන් අන්යෝන්‍ය දයාව, ලෝකාවබෝධය, මානව සබඳතා පිළිබඳ අත්දැකීම්, සමාජ-සංස්කෘතික වටිනාකම් සහ මූලික කලා ශිල්ප පිළිබඳ අවබෝධය සහ ආත්මවිශ්වාසය සහ ගෞරවය වැනි නාට්‍ය හා රංග කලාවේ වැදගත්ම ඉගෙනුම් ප්‍රතිඵල අත්විදීමට දරුවාට අවස්ථාව ලබා දෙයි.

### කාට ද:

මෙම වැඩසටහන මූලික වශයෙන් නිර්මාණය කර ඇත්තේ පාසලේදී නාට්‍ය සහ රංග කලාව විෂයයක් ලෙස හදාරන 7 වන ශ්‍රේණියේ සිට අපොස සාමාන්‍ය පෙළ ශ්‍රේණිවල ළමුන් සඳහා ය. කෙසේ වෙතත්, වැඩසටහන ක්‍රියාකාරකම් මත පදනම් වූවක් බැවින් නිර්මාණශීලී සහ නාට්‍ය හා රංග කලාව පිළිඹඳ උනන්දුවක් හා කුතුහලයෙන් යුතු ඕනෑම සිසුවෙකුට වැඩසටහනට සම්බන්ධ විය හැකිය. එවැනි සිසුන් සඳහා මෙම වැඩසටහනේ ක්‍රියාකාරකම් දරුවා පාසලේදී ලබා ගන්නා විධිමත් අධ්‍යාපනයට අතිරේකයක් ලෙස ද සැලකිය හැකිය.

**<u>ඉගෙනීමේ ප්‍රතිඵල:</u>**

මෙම වැඩසටහන සහභාගිවන ළමුන්ට පහතින් දී ඇති මූලික කරුණු ඉගෙන ගැනීමට සහ අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දේ

- නාට්‍ය හා රංගනයේ ආරම්භය, ස්වභාවය සහ විවිධ ශෛලීන්
- නාට්‍ය රංගනයේ විවිධ ක්‍රම
- විකල්ප ප්‍රකාශන මාධ්‍යයක් ලෙස නිදහස් හා ව්‍යුහගත චලනයන්
- සංගීතය ඇගයීම සහ ගායනය
- චිත්‍ර, අත්වැඩ සහ රූකඩ
- භාෂා ප්‍රවීණතාවය.

වැඩසටහන මෙහෙයවන්නේ මහාචාර්ය චන්දන අලුත්ගේ සහ නිලංක දහනායක විසිනි. මීට අමතරව, ළමුන් සමඟ වැඩ කිරීම සඳහා විශේෂ පුහුණුවක් ලබා ඇති කලාකරුවන්/නාට්‍ය ගුරුවරුන් ද වැඩසටහන මෙහෙයවීමට සහාය වේ.

**<u>කාලය</u>**

මෙම වැඩසටහන ජනවාරි සිට මාර්තු දක්වා, මැයි සිට ජූලි දක්වා සහ සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා වසරකට වාර තුනකින් ඉදිරිපත් කරනු ලැබේ. **එමනිසා පාඨමාලාවට පහසුවෙන් සම්බන්ධවිය හැක. පාඨමාලාවට සම්බන්ධවූ සිසුන්ට අඛණ්ඩව අපොස සාමාන්‍ය පෙළ දක්වාම නාට්‍ය හා රංග කලාව ඉගෙනීමට අවස්ථාව ඇත.**

වැඩසටහන සඳහා සිසුන් ලියාපදිංචි කිරීම පැමිණෙන පිළිවෙලට සිදුකරනු ලැබේ.
වැඩසටහන **සෙනසුරාදා** දිනවල **පෙරවරු 11.15 සිට පස්වරු 2.15 දක්වා පැවැත්වෙයි.**
පාඨමාලාව මැයි මස 4 වන **සෙනසුරාදා පෙරවරු 11.15** ට ආරම්භ වේ.

සහභාගි වන දරුවන්ට තම ආහාර පාන රැගෙන එන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. නාට්‍ය සැසිවාරයට සහභාගි වීමට දරුවන්ට සුදුසු ඇඳුම් (වඩාත් ලිහිල් ඇඳුම්) සැපයිය යුතුය.

වැඩසටහන සඳහා ගාස්තුව එක් වාරයකට ළමයෙකුට රු. 6000/= ක් සහ ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 500/= කි. ලියාපදිංචියේදී සම්පූර්ණ ගාස්තුව (රු. 6500/=) එක් වාරිකයකින් ගෙවන ලෙස දෙමාපියන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

**<u>ස්ථානය</u>**

බත්තරමුල්ල ජයන්තිපුර ප්‍රධාන මාර්ගයෙහි පිහිටි බත්තරමුල්ල සිංහ සමාජ ශාලාවේදී වැඩසටහන පවත්වනු ලබයි.